ආරක්ෂක අමාත්‍යාංශය

# රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරිය

## ඇබෑර්තු

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවත්නා රසායනික අවි සම්මුතිය ක්‍රියාත්මක කිරීමේ ජාතික අධිකාරියේ පහත තනතුරු සඳහා ස්ථිර පදනම මත බඳවාගැනීමට සුදුසුකම්ලත් ශ්‍රී ලාංකීය පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**තනතුර** : සහකාර අධ්‍යක්ෂ (ක්‍රියාත්මක කිරීම් සහ බලපත්‍ර) (පුරප්පාඩු 01)
: සහකාර අධ්‍යක්ෂ (පුහුණු, හදිසි අවස්ථා, පර්යේෂණ හා සංවර්ධන) (පුරප්පාඩු 01)

**වැටුප් ක්‍රමය** : MM 1-1 2016 - රු. 53,175 – 10 X 1,375 – 15 X 1,910 – 95,575
මෙම වැටුපට අමතරව ඉහත තනතුරට අදාළ සියලුම රජයේ අනුමත දීමනා ගෙවනු ලැබේ.

**අධ්‍යාපන සුදුසුකම්** :

**බාහිර අයදුම්කරුවන් :**

රසායන විද්‍යාව විශේෂවේදී හෝ ඉංජිනේරු (රසායනික) යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම.

සහ

සුදුසුකම් ලබා ගැනීමෙන් පසු රජයේ, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් රසායනික සුරක්ෂිතතාවය, හදිසි අවස්ථා කළමනාකරණය යන ක්ෂේත්‍රයන්හි වසරක (01)ක පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

**වයස** : අයදුම්පත් කැඳවනු ලබන අවසාන දිනට වයස අවුරුදු 22ට නොඅඩු සහ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.

**පත්වීමෙහි ස්වභාවය** : මෙම පත්වීම ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත වේ.

**වෙනත් කොන්දේසි** :

- ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.
- තනතුරට පැවරෙන රාජකාරි නිසි අයුරින් ඉටු කිරීම සඳහා අවශ්‍ය මානසික හා ශාරීරික යෝග්‍යතාවයක් තිබිය යුතුය.
- විශිෂ්ට චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.
- විශිෂ්ට ඉංග්‍රීසි භාෂා සන්නිවේදන හැකියාවක් තිබිය යුතුය. (ලිඛිත සහ කථන)

- ඉහත තනතුරු වලට අදාළ සුදුසුකම් සපුරන ලද අයදුම්කරුවන් තම අයදුම්පත්‍රය සමග ජීවදත්ත පත්‍රිකාව, ඔබ ගැන විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් සහිතව 2023.11.10 දිනට හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපැල මගින් "**ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක සේවා අංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර, කෝට්ටේ.**" යන ලිපිනයට ලැබෙන පරිදි එවිය යුතුය. තවද, දැනටමත් රජයේ / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයෙහි නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය.

- අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඔබ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු අතර, නියමිත දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට සිදුවන බවද දන්වමි.

**ලේකම්**
ආරක්ෂක අමාත්‍යාංශය
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ